ශීර්ෂය 318 - ඌව පළාත් සභාව - 2022
-----------------------------------------

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය
---------------------------------------

1.1 දැක්ම
-------

"පරමාදර්ශිත තිරසාර සංවර්ධනයක්"

1.2 මෙහෙවර
-----------

"ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා සම්පත් බලමුළු ගැන්වීම සහ ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම."

1.3 කාර්ය භාරය
-------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. මූල්‍ය ප්‍රකාශන
---------------

මුළු ප්‍රතිපාදනය හා වියදම
-----------------------------

ඌව පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 29,711 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 28,466 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,245 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.1 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2022 දෙසැම්බර් 31 දිනට | | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 26,958 | 26,606 | 352 | 1.3 |
| මූලධන | 2,753 | 1,860 | 893 | 32.4 |
| එකතුව | 29,711 | 28,466 | 1,245 | 4.1 |

3. විගණන නිරීක්ෂණය
-----------------------

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.